# أدعــــــة

## පශ්චාත්තාප වී අල්ලාහ්ගෙන් අයැද සිටීම

## Beseeching, & humbly- seeking

## Allah’s Blessings

## Du’a දුආ හෙවත් ප්‍රාර්ථනාව

## The Weapon of the Believer :in Sinhala)

## විශ්වාසවන්තයින්ගේ ආයුධයකි

a treatise on the status and etiquette of du’a in Islam-

by

Abu Ammar Yasir Qadhir

අබූඅම්මාර් යාසිර් කාදිර් විසින් ප්‍රකාශකල ග්‍රන්ධයෙන් කෙටිකර

ප්‍රකාශ කිරීම අබ්දුල්රහ්මාන් ආබිදීන් විසින්

abridged and published by Abdulrahman Abedeen

بِسْمِ اللهِ الرَّحْمٰنِ الرَّحِيمِ

وَقَالَ رَبُّكُمُ ادْعُونِي أَسْتَجِبْ لَكُمْ

إِنَّ الَّذِينَ يَسْتَكْبِرُونَ عَنْ عِبَادَتِي سَيَدْخُلُونَ جَهَنَّمَ

دَاخِرِينَ ﴿٦٠﴾

And your Lord has stated: Make Du’a to Me, I will (of a surety) respond to you. Verily, those who are too arrogant to worship Me will enter the Fire of Hell, humiliated. (Surah al-Ghaafir, (The Forgiver) 40:60)

Note: Yusuf Ali -4434: As this life is not the end of all things, and we are to have its fulfilment in the Hereafter; we have only to pray to the Lord of the Present and Hereafter, and He will hear us, forgive us, guide us, and make our Path smooth. But Pride will have its fall, and its humiliating Punishment:

40:60. உங்கள் இறைவன் கூறுகிறான்: “என்னையே நீங்கள் பிரார்த்தியுங்கள் நான் உங்(கள்பிரார்த்தனை)களுக்கு பதிலளிக்கிறேன்.

**ඔබගේ දෙවියන් මෙසේ පවසන්නේය: ඔබ (ඔබට අවශ්‍ය දැය සියල්ල ඉල්ලා සිටීමට) මාවම ආරාධනා කරනු. මා ඔබට, (ඔබගේ ප්‍රාර්ථනාවන්ට) පිළිතුරු දෙන්නෙමි. කවුරුන් මාව නොනැමද ආඩම්බර බස් ඟදොඩන්නෝද, ඔවුන් නියත වශයෙන්ම දීනවූ අය වශයෙන් නිරයට ඇතුළු වනු ඇත.**

# ප්‍රාර්ථනාව

**අපගේ උත්සාහය හා දැඩි විශ්වාසය මත උදව්වේ හා සාර්ථකත්වයේ දිව්‍යමය පොරොන්දුව සම්බන්ධ වී ඇත. බියගුල්ලාට හා අවිශ්වාස කරන කම්මැලියාට කිසිවක් ළගා නොවේ. අවදානම් හා දුෂ්කරතාවයන් , පාපයට ඇද දමන ගැටලු පිළිබඳව අපට අනාවැකි පළ කරනු ලැබී ඇත. එබැවින් ඒවාට අපි එඩිතරව හා ධෛර්යයෙන් මුහුණ දිය යුතුය. නබි (සල්) තුමාණෝ "අල්ලාහ්ගෙන් කිසිවක් නොඅයදින පුද්ගලයා කෙරෙහි අල්ලාහ් කෝප වන්නේය" යැයි පැවසූහ.**

(තිර්මිදි)

**කොන්දේසි 4ක් මත කුහකයාට ද පාපක්ෂමාව ලබා ගත හැකිය.**

1. ඔවුන්ගේ මනස පිරිසිදු කරන අවංක පශ්චාත්තාපය.
2. ඔවුන්ගේ බාහිර ජීවිතය පිරිසිදු කරන ආකාරයට ඔවුන්ගේ කල් කි්‍යාව නිවැරදි කර ගැනීම,
3. පාපයට ඇද දැමීමේ ආක්‍රමණ(කටයුතු) වලින් අල්ලාහ් ආරක්ෂා කරයි යන දැඩි ස්ථිර බව හා ඔවුන්ගේ ආත්මය අල්ලාහ්ට පරිත්‍යාග කිරීම,
4. විශ්වාසයේ පරිපූර්ණ සාමාජිකත්වය රැගෙන එන ඔවුන්ගේ ආගමේ අවංක බව හෝ ඔවුන්ගේ අභ්‍යන්තර කරුණු වල අවංකබවෙන් කටයුතු කිරීම.

දුආ හෙවත් ප්‍රාර්ථනා යනු අල්ලාහ් සමඟ වන සජීවී සන්නිවේදනයකි.

දේව යාඥාව සහ ප්‍රාර්ථනාව:

1) අල්ලාහ් ව සිහිපත් කිරීම
2) දුආ හෙවත් ප්‍රාර්ථනාව, කළාකද්ර් (දේව නිර්ණය) වැළැක්වීම සඳහා වූ එකම බලගතු ක්‍රියාව වේ.

(නබිවරයාණනි)! ඔබගෙන් මාගේ ගැත්තන් මා පිළිබඳව නුඹගෙන් විමසුවහොත් නියත වශයෙන්ම මා (ඔවුනට) ඉතා සමීපයැයි (පවසනු) යෙහිම සිටින්නෙමිග ප්‍රාර්ථනා කරන්නා (මා) අමතන විට (ඔහුගේ) ප්‍රාර්ථනාවට මම පිළිතුරු දෙමිග එබැවින් ඔවුහු ම(ගේ ඇමතීම)ට සවන්

දෙත්වා තවද මා කෙරෙහි විශ්වාස කරත්වා෴ (මින්) ඔවුනට නිවැරදි මඟපෙන්වීම ලබා ගත හැකිය.

(2 : 186)

**1) දුආ හෙවත් ප්‍රාර්ථනා යනු අල්ලාහ් සමඟ වන සජීවී සන්නිවේදනයකි.**

අපගේ භාරකරු (පරමාධිපති) වන, අපට වඩා අපගැන මැනවින් හඳුනන අල්ලාහ්ගෙන් අප කුමක් ඉල්ලන්නේද ඒ සියල්ල ලබාදීමට ඔහු සූදානමින් සිටී. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළහ : අප පිළිකුල් කරන (ඇකමැති) දේවල් අප වෙනුවෙන් නිර්ණය කර හමාරය. එයින් අපට ආරක්ෂාව ලබා දෙන මෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීමෙන් තොර එයින් මිදීමක් නැත. එම නිසා අල්ලාහ්ගෙන්, එවැනි දේවල්වලින් ආරක්ෂා කර දෙන මෙන් ප්‍රාර්ථනා කිරීම මගින් නියතවශයෙන්ම අල්ලාහ්, එවැනි ඒවායින් අපව ආරක්ෂා කරයි. එසේ නොමැති නම් අවාසනාවන්ත දේවලට අපට මුහුණ දීමට සිදුවනු ඇත.

**2) දේව යාඥාව සහ ප්‍රාර්ථනාව**

අල්ලාහ් පැවසූ බව නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළ එක අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි. අල්ලාහ් සෑම රාත්‍රියකම අවසන් තුන්වන කොටසෙහි පහළ අහසට පැමිණ මාගෙන් ප්‍රාර්ථනා කරන්නේ කවුදරු? මම ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකර දෙන්නෙමි. කවුරුන්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර දෙන මෙන් මාගෙන් ඉල්ලන්නේද ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා දෙන්නෙමි. කවුරුන් මාගෙන් පාපක්ෂමාව ඉල්ලන්නේද මම ඔවුන්ගේ පාපයන්ට සමාව ලබා දෙන්නෙමි යැයි පවසයිග (තිර්මිදී) මුස්ලිම් ග්‍රන්තයෙහි මෙම දැනුම් දීම ප්‍රථම ෆජ්ර් උදාවන තෙක් දැනුම් දෙමින් සිටින බව වාර්තා වේ.

**3) අල්ලාහ් ව සිහිපත් කිරීම**

අල්ලාහ් පැවසූ බව නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි. මගේ ගැත්තා කෙසේ මා පිළිබඳව සිතන්නේද ඒ ආකාරයටම මමද කටයුතු කරමිගමාව සිහිපත් කරනතාක්කල් මම ඔහු සමඟ සිටිමි. ඔහු, තමා තුළ ම මාව සිහිපත් කරන්නේ නම් මම ද ඔහුව මා තුළ සිහිපත්

කරන්නෙමි. ඔහු මාව කණ්ඩායමක් ඉදිරියේ සිහිපත් කර සිටියි නම් මම ද ඔහුව කණ්ඩායමක් ඉදිරියේ ඊට වඩා උතුම් ආකාරයට සිහිපත් කරන්නෙමි. ඔහු මා වෙත වියතක් සමීප වන්නේ නම් මම ඔහු වෙත රියනක් සමීප වන්නෙමි. ඔහු මා වෙත ඇවිද එන්නේ නම් මම ද ඔහු වෙත එසැනින් සමීප වන්නෙමි.තවත් වාර්තාවක මාගේ ගැත්තා, මම කෙසේ සිටිය යුතු යැයි සිතන්නේ ද මම එලෙසම සිටිමි. එනම්, අල්ලාහ්, තමාගේ පාපයන් සමාකර ඔහුගේ දයාව තමා හට ලබා දිය යුතු යැයි අපේක්ෂාවෙන් සිටියි නම් ඔහුගේ විශ්වාසයට අනුව පාපක්ෂමාවත් දයාවත් ලැබේ.

(බුහාරි, මුස්ලිම්, තිර්මිදි, ඉබ්නු මාජා)

## 4) දුආ හෙවත් ප්‍රාර්ථනාව, කළාකද්ර් (දේව නිර්ණය) වැළැක්වීම සඳහා වූ එකම බලගතු ක්‍රියාව වේ.

නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළහ :දේව නිර්ණය වැළැක්වීමට දුආ හෙවත් ප්‍රාර්ථනා ව හැර වෙන කිසිවක් නොමැත.

(තිර්මිදි 139, හසන් අල් කබීර්, අල්බානි තම ග්‍රන්තයෙහි හසන් යැයි පවසයි)

ඉහත හදීසයට අනුව අල්ලාහ් තම අභිමතය පරිදි, මිනිසෙකුට අවාසනාවන්ත නැතිනම් දුෂ්කර අවස්ථාවක් නිර්ණය කර තිබීමට ඉඩ ඇත. එමනිසා ඔහු කරනා ප්‍රාර්ථනාවෙහි අවංකභාවය හා ගුණාත්මකභාවය හේතුකොට ගෙන එම අභාග්‍යය වලක්වා මෙම නියමය වෙනස් කළ හැකිය. එමනිසා සෑම මුස්ලිම්වරයෙකුම තමාට අනාගතයේ එළඹිය හැකි අවාසනාවන්ත හෝ දුෂ්කර අවස්ථාවන් ගෙන් තමාව ආරක්ෂා කර ගැනීමට අල්ලාහ්ගෙන් ඉල්ලීම හැර වෙන මගක් නොමැත.

## 5) දුආ හෙවත් ප්‍රාර්ථනා ව, කළාකද්ර් - දේව නිර්ණය(දෛවය) වෙනස් කර වීමේ එකම බලගතු ක්‍රියාව වේ.

යම් පුද්ගලයෙකු කරන ප්‍රාර්ථනාවන්, ඔහුට ඇතිවිය හැකි අවාසනාවන්ත සිදුවීම්වලින් වළක්වනවා සේම එය වෙනස් කර, එයවෙනුවෙන් වෙනත් යහපතක් සැලැස්වීමට තරම් බලසම්පන්නය. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළහ : යමෙකු පතන ආත්මාරක්ෂාව, ඔහුට එරෙහිව නිර්ණය කර තිබූ කළා කද්ර් (දෛවය) ට එරෙහි ව කිසිම යහපතක් ළඟා නොකරයි. ඔහු

කරනා ප්‍රාර්ථනාවන්, ඔහුට සිදුවී තිබෙන හා සිදුවීමට නියමිත අයහපත උදෙසා ප්‍රයෝජනවත් වේග සැබැවින්ම ප්‍රාර්ථනාව උක්ත අයහපතට එරෙහිව කියාමත් දිනය දක්වා මොහු වෙනුවෙන් පෙනී සිටී.

## 6) කළා කද්ර් - දෛවය

අල්ලාහ් ගේ විනිශ්චය පිළිබඳව නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළ හදීස් බහුලව සඳහන් ව ඇත. අල්ලාහ් ගේ විනිශ්වයට පටහැනිව සෑම උත්සහයක් ව්‍යර්ත වනු ඇත. නමුත් **දුආ** ව පමණක් සෑම දෙයකටම සාර්ථකව උපකාරී වේ. එමනිසා, අල්ලාහ් ගේ ගැත්තණිය අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරන මෙන් ඔබලා ට දේශනා කරන්නෙමි.

එමනිසා මිනිසෙකු කොපමණ අවධානයෙන් සිටියත් ඔහු වෙනුවෙන් නිර්ණය කර ඇති දෙයින් බේරීමට නොහැකිය. මන්ද යත් සියල්ල පාලනය කරන්නා අල්ලාහ් මය. ඔහුගේ දැනුම, ශක්තිය හා බලසම්පන්නභාවයෙන් කිසිවක් මඟ නොහැරේ. නමුත් දුආ ප්‍රාර්ථනා මගින් ඔහු වෙත සමීප වීමෙන් ඔහු නිර්ණය කර ඇති දෙයින් අප ව ආරක්ෂා කරයි යැයි නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව සල්මාන් අල් ෆාරිසී (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි. දුආ ප්‍රාර්ථනා ව හැරෙන්නට වෙන කිසිවක්, මිනිසාව අල්ලාහ් නිර්ණය කළ දෛවයෙන් නොවළක්වනු ඇත. එසේම යමෙකු කරනා යහක්‍රියාවන් හැර වෙන කිසිවක් මිනිසෙකුගේ ආයුෂ වැඩි නොකරයි.

මෙම හදීසය අපට අඟවන්නේ දෛවය වෙනස් කිරීමට අප භාවිතා කළ යුතු එකම ආයුධය “දුආ” ව පමණක්මය යන්නයි. එමගින් මනුෂ්‍ය ජීවිතයෙහි අල්ලාහ් නිර්ණය කර ඇති සමහර අප්‍රසන්න දේවල් වළක්වා ගත හැකග කෙතරම් අවධානයෙන් සිටියත් ඔහුට තමාව අල්ලාහ්ගේ නිර්ණයෙන් බේරා ගත නොහැකග එබැවින් සිදු වුණ නැතිනම් සිදු වීමට ඇති පරීක්ෂණවලින් තමාව ආරක්ෂා කරගත හැකි එකම මග දුආ ව පමණය. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ : යමෙකු කරනා ප්‍රාර්ථනාවන් ඉහළට ගොස් ඔහුට එරෙහිව නිර්ණය කරන ලද දෛවය සමග සටන් කරයි. මෙම සටන කියාමය දක්වා අඛණ්ඩව පවතියි යැයි පැවසූහ.

## 7) දුආ ප්‍රාර්ථනා අවස්ථාවෙහි අත් අය අබියස උස් හඬින් හැඬීම

හැඬීම, දුආ ප්‍රාර්ථනාවෙහි අංගයක් ලෙස ගැනුනද මිනිසෙකු දුආ ප්‍රාර්ථනා අවස්ථාවෙහි අන් අය අබියස උස් හඬින් හැඬීමෙන් වැළකී සිටිය යුතුය. සමහර මස්ජිදයන් හි දුආ ප්‍රාර්ථනා අවස්ථාවෙහි සියලු දෙනාම එක්ව උස් හඬින් හඬති. ඈතට ඇසෙන සේ ඉතා උස් හඬින් හඬති. මිනිසුන්ගේ මෙවැනි ක්‍රියා කලාපයන් හා අනුගමනයන්, නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පෙන් වූ මග වන සුන්නාවට හා පෙර විසූ යහමග ගිය ඇත්තන්ගේ මගට හාත් පසින්ම වෙනස්ය.කෙනෙකු අන් අය ඉදිරියේ දුආ කරන විට ඔහුගේ හැඬීම පාලනය කරගැනීමට උත්සහ කළ යුතුයග මන්ද ඔහු හා ඔහුගේ මැවුම්කරුවා අතර ව පුද්ගලික නැමදුමකිග කෙසේ නමුත් ඔහුට ඔහුගේ හැගීම් පාලනය කරගත නොහැකිව (හැඩුවේ නම්) ඔහුට වරදක් නොමැතග නමුත් එය නොකඩවා සිදුවීමෙන් වළක්වා ගත යුතුය.

## 8) දුආ ප්‍රාර්ථනාව වෙනුවෙන් ඇති වගකීම

නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි. මිනිසෙකු අල්ලාහ් වෙත කුමන අවශ්‍යතාවක් ඉදිරිපත් කළත් නියතවශයෙන්ම ඒවා ඉටු කර දෙයි. නැතහොත් ඔහු නොඉල්ලූ යමක් ඒ වෙනුවට ලබා දෙයි. නැතහොත් ඥාතී සම්බන්ධතා බිඳ දැමූ වරද වෙනුවෙන් එය සපුරාගනියි. එම අවස්ථාවෙ සහාබිවරයෙකු අපි අල්ලාහ්ගෙන් සෑම දෙයක්ම අහනවනේ, යැයි පැවසූ විට නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ අල්ලාහ් සෑම දෙයින් ම පරිපූර්ණ කෙනෙක් ය යැයි පිළිතුරු  දුන්නේය.

ඉහත් හදීසයේ ආකාරයට ගැත්තෙකු අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා සඳහා වූ කොන්දේසි පරිපූර්ණ කළ තත්වයෙන් අල්ලාහ්ගෙන් කරන්නා වූ ප්‍රාර්ථනාවන්ට පිළිතුරු ලබා දෙන බව තමා තුළම සහතික වී ඇත. මෙහිදී අල්ලාහ් ගෙන් ගැත්තෙකු පතන දේ සඳහා පිළිතුරු ලබා දෙන විට ඔහු පැතූ දේ එයාකාරවම ලබා දෙයි. නැතහොත් පැතූ දේ වෙනුවට ඔහුට සිදුවිය හැකි අයහපතින්  ඔහුව මුදවා ගනී.

එමනිසා ගැත්තා ප්‍රාර්ථනා නොකර කුමන ප්‍රතිඵලය ද ලබා හැක්කේ? ඇත්තෙන්ම ඔහුට පාපක්ෂමාව ලබා ගත නොහැකිය. ගැත්තෙකු දුආ ප්‍රාර්ථනාවන්ගේ ප්‍රතිඵලය ඔහුට යහපතක් මිස වෙන යමක් නොමැත. ඉමාම් ඉබ්නු හජර් (රහිමහුල්ලාහ්) මෙසේ පවසයි. සෑම තනි

මිනිසෙකුම කරන්නා වූ ප්‍රාර්ථනාවන් සඳහා අල්ලාහ් පිළිතුරු ලබා දෙන්නේය. නමුත් එම පිළිතුරෙහි සැබෑ තත්වය වෙනස්විය හැකිය. සමහර ඔහු පතනා දෙය එලෙසම ලැබිය හැකිය. නැතිනම් ඒ වෙනුවට ඒ හා සමාන යමක් ලැබිය හැකිය.

## 9) දුආ ප්‍රාර්ථනා ඉතා සැහැල්ලු නැමදුමකි

දුආ ප්‍රාර්ථනා වෙනුවෙන් ලැබෙනා ප්‍රයෝජන පිළිබඳව කෙනෙකු කියවන අවස්ථවෙහි මෙවැනි උසස් කුසලයන් සාමාන්‍ය ක්‍රියාවන් මගින් හිමි කර ගත නොහැකිය යැයි සිතයි. සැබවින්ම එවැනි හැඟීම්, නිවැරදි හා සාධාරණ ලෙස තිබුණද දුආ ප්‍රාර්ථනා ව සෑම කෙනෙකුටම කළ හැකි නැමදුමකි. ඒ වෙනුවෙන් කැපකරන ශක්තිය හා කාලය ඉතා සුළුය.

දුආ ප්‍රාර්ථනාව නිශ්චිත ස්ථානයකට හෝ කාලයකට නිශ්චිත වේලාවකට හෝ නිශ්චිත පුද්ගලයින්ට හෝ නිශ්චිත කරුණු කාරණාවලට සීමා නොවූවකි. ස්ත්‍රී පුරුෂ, තරුණ මහළු, දුප්පත් පොහොසත්, මෘදු සිතැත්තවුන් හා රළු සිතැති සෑම කෙනෙකුටම ඕනෑම තැනක සිට ඕනෑම කාලයක ඕනෑම වේලාවක කළ හැකි ඉබාදතයකි. මෙයට අවශ්‍ය වන්නේ බැගෑපත් විශ්වාසවන්ත සිතක් පමණි.

## 10)සීමා ඉක්මවන අන්දමට දීර්ඝ වේලාවක් සාමූහිකව ප්‍රාර්ථනා කිරීම

සාමූහිකව කරනා ප්‍රාර්ථනාවන්හි සිදුවන වැරදි, ඉමාම් සීමාව ඉක්මවා ඉතා දීර්ඝ ලෙස ප්‍රාර්ථනා කිරීමයිග මිනිසුන් ඉවසීම ඉක්මවා තම අතෘප්තිය පිට කරන තරමට  ඉමාම් ඉතා දීර්ඝ ලෙස දුආ ප්‍රාර්ථනා කිරීම සුවදායි නොවේග තමාට පිටුපස කාන්තාවන්, කුඩා දරුවන්, වයෝවෘද්ධයින්, රෝගීන් සිටිති යන්න අවධානයට ගෙන ඔවුනොවුන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගත යුතුයග නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ මුආද් බින් ජබල් (රළියල්ලාහු අන්හු) තුමා ඉමාමත් කරනා විට සලාතයේ ඉතා දීර්ඝ සූරාවන් පාරායණා කිරීම වැළකූ අතර මෙය සලාතය යෙදෙනා මුස්ලිම්වරුන්ව අසීරුතාවයට ලක් කිරීමකි යැයි පැවසූ හදීසය මෙයට උදාහරණයක් ලෙස දැක්විය හැකියග මෙවැනි මාර්ගෝපදේශයන් සාමූහක ප්‍රාර්ථනාවන්හි දී අනුගමනය කළ යුතුය.

## 11)ප්‍රාර්ථනා කරන අවස්ථාවන්හි දෑත් එසවීම

ප්‍රාර්ථනා කරන අවස්ථාවන්හි ලොකු කුඩා, තරුණ මහළු, රෝගී වුවද සියළු දෙනාම අනුගමනය කරන උතුම් මාර්ගයකි දෑත් එසවීමග සැබවින්ම ප්‍රාර්ථනා කරන අවස්ථාවන්හි දෑත් එසවීම සම්බන්ධයෙන් බහුතර හදීසයන් හි විවිධ ආකාරයට මනාව සඳහන් වී ඇතග ෂෙහුල් ඉස්ලාම් ඉබ්නු තයිමියා (රහිමහුල්ලාහ්) පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කර සිටීග දුආ ප්‍රාර්ථනා කරන අවස්ථාවන්හි නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ තම දෑත් ඔසවා ඇත යන කාරණාවෙහි සැලකිල්ලට නොගෙන සිටිය නොහැකි තරමටම ඒ සම්බන්ධයෙන් විවිධ හදීස්වලින් ගෙන හැර දක්වා ඇත.

තවද සල්මානුල් ෆාරිසී (රළියල්ලාහු අන්හු) තුමාණෝ වාර්තා කරයිග නියතවශයෙන්ම අල්ලාහ් තමාගෙන් අත් දික්කර යදින්නා කෙරෙහි ලැජ්ජාවට පත්වන්නේයග සෙනෙහය දක්වයිග ඔහුගේ ගැත්තා ප්‍රාර්ථනා කර යමක් ඉල්ලා සිටි අවස්ථාවේ එය ලබා නොදී හිස් අතින් ගැත්තාව පත්කිරීමෙහිලා අල්ලාහ් ලැජ්ජාවට පත්වන්නේයග සුබ්හානල්ලාහ්ග තමා විසින් මවන ලද ගැත්තෙකු තමාගෙන් යමක් දෑත් එසවා ප්‍රාර්ථනා කිරීම උදෙසා මැවුම්කරු ලැජ්ජාවට පත්වන්නේද? සැබවින්ම අල්ලාහ්ගේ පරිත්‍යාගශීලීබාවය හා ඔහු ලබා දෙන කුසල්, හා දක්වන දයාව, කරුණාව,බියබැති භාවය නිසා සිත් පිරී යයි.

එමනිසා ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි දෑත් ඔසවා තිබීම අවශ්‍ය කරුණකිග නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ ප්‍රකාශ කළ බව මාලික් බින් යසාර් (රළියල්ලාහු අන්හු) තුමා පවසයිග "නුඹලා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන විට නුඹලාගේ අත්ල දෙවිඳුන් දෙසට ඔසවා ප්‍රාර්ථනා කරන්නග නුඹලාගේ දෑත් පහළ නොහෙළන්නග මන්දයත් දෑත් පහළට හෙළා කරන ප්‍රාර්ථනාවන්හි කිසිදු ඵලක් හෝ යහපතක් අත්කර ගත නොහැකග මන්දයත්, එය තම උඩගුකමට හා තමා ඉදිරිපත් කරන කාරණාවෙහි කිසිඳු අවශ්‍යතාවයක් නොමැති බවට වූ සංකේතයයි.
දුආ ප්‍රාර්ථනාව වෙනුවෙන් දෑත් එසවිය යුතු ආකාරය පිළිබඳව වෙනස් ආකාර 3 කට සහාබාවරු විසින් වාර්තා කර ඇත.

දෑත් නොඔසවා ඇඟිල්ලෙන් සංඥා කිරීම :- මෙය කෙනෙකු වෙන කෙනෙකුගෙන් සමාව අයදින විට, නැතහොත් පොදු ඞික්ර් කරනා විට නැතහොත් කුත්බා දේශන පවත්වන අවස්ථාවන්හි නැතිනම් අත්තහියියාත් හි සිටින අවස්ථාවෙහි මෙලෙස කළ හැකිය.

අත්ලයන් අහස දෙසට යොමු වන පරිදි දෑත් තම උරහිස දක්වා එසවීම :- මෙය සාමාන්‍යයෙන් දුආ ප්‍රාර්ථනා කරන ක්‍රමයයි .

මෙය ඉතා අසීරු දුක්බර අවස්ථාවෙහි පමණක් දෑත් ඔසවන ආකාරයයිග උදාහරණයක් වශයෙන් දැඩි ඉඩෝරයක් පවතින අවස්ථාවෙහි වර්ෂාව පතා ප්‍රාර්ථනා කරන අවස්ථාව නැතිනම් සතුරන් පහරදීමට පැමිණෙන අවස්ථාවෙහි ඔවුන්ගෙන් ආරක්ෂාව ලබා දෙන මෙන් අල්ලාහ්ගෙන් යදින වේලාව වැනි අවස්ථාවන්හි ප්‍රාර්ථනා කරන විට තම දෑත එකිනෙකට ළං නොකර අත්ල සම්පූර්ණයෙන් පෙනෙන ආකාරයට ඉදිරියට දෑත් දිගු කර අහස දෙසට එසවිය යුතුය.

ඉහත සඳහන් ආකාර ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමාගේ වාර්තාවන් අනුව තහවුරු කරනු ලැබේග එනම්, සෑම ප්‍රාර්ථනා අවස්ථාවක දීම මුස්ලිම්වරයෙකු තම උරහිස දක්වා දෑත් එසවිය යුතුය ඉස්තිඃග්ෆාර් කරන විට තම අඟිල්ලෙන් සංඥා කළ යුතුයග අසීරු දුෂ්කර අවස්ථාවන්හි අත්ල සම්පූර්ණයෙන් පෙනෙන ආකාරයට ඉදිරියට දෑත් දිගු කර අහස දෙසට එසවිය යුතුය.

(අබූ දාවුද් : 1486)

සාමාන්‍යයෙන් කෙනෙකු ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි තම දෑත එසවිය යුතුයග නමුත් සිකුරාදා දිනයන්හි ඉමාම් කුත්බා දේශනය පවත්වන අවස්ථාවෙහි ඉමාම් හෝ අනෙකුත් අය හෝ දෑත් එසවිය යුතු නොමැතග මන්දයත් එලෙස කිසිම අවස්ථාවක නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පෙන්වා දී නොමැතග එය සුන්නාවක් ද නොවේග එවගේම නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පෙන්වා දුන් අවස්ථාවාදී දුආවන්හි දෑත් එසවිය යුතු නොමැතග එලෙසද නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පෙන්වා දී නොමැතග උදාහරණයක් වශයෙන් මස්ජිදයට ඇතුළුවන විට, වැසිකිළියට යන විට හා උදේ සවස දුආවන් පෙන්වා දිය හැකිය.

## 12)6 දුආ ප්‍රාර්ථනා අවස්ථාවෙ ඇඬීම

ඇඬීම යනු ප්‍රාර්ථනා අවස්ථාවෙහි තම සැබෑ ස්වරූපය පිට කරනා ක්‍රමවලින් එකකිග මෙය අල්ලාහ් ඉදිරියේදී කෙනෙකු තබා ඇති තැම්පත්භාවය පිටකරන අතර තමා ඉදිරිපත් කරන ඉල්ලීමේ වැදගත්භාවය ගෙනහැරපාන්නකිග තවද ගැත්තෙකු තම පරමාධිපති

ස්වාමියා අභියස කෙතරම් අවශ්‍යතා ඇත්තෙකු ද යන්න පෙන්නුම් කරන්නකිග එවගේම ඔහුගේ උදව් නොමැතිව කිසිවිටකත් සිටිය නොහැකියග එක් අවස්ථාවක නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් අල් කුර්ආන් වැකිය පාරායණා කරමින් සිටියේය. පරමාධිපතියාණනි

මෙම වැකිය පාරායණා කිරීමෙන් අනතුරුව පරමාධිපතියාණනි මාගේ සමාජය මාගේ සමාජය යැයි පවසා හැඬීමට පටන් ගත්තේයග එම අවස්තාවේ අල්ලාහ් ජිබ්රීල් (අලෛයිහිස්සලාම්) තුමාව අමතා (අල්ලාහ් සියල්ල දන්නා ය) නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන්ව ඇඬෙව්වේ කුමක්ද ? යැයි විමසා එන ලෙස යැවුවේයග ජිබ්රීල් (අලෛයිහිස්සලාම්) තුමා, නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ විමසූ විට නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ මෙලෙස පිළිතුරු දුන්නේයග ඉබ්රාහිම් ඊසා (අලෛයිහිමස්සලාම්) තුමාණන් තම සමුදාය ගැන සිතා හැඬුවා සේ මමත් මාගේ සමුදාය ගැන සිතා හැඬුවෙමි යැයි පැවසූහ.

## 13)7 නිශ්ශබ්දව ප්‍රාර්ථනා කිරීම

දුආ ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි වෙන අයට ඇසෙන ආකාරයට උස් හඬින් ප්‍රාර්ථනා නොකළ යුතුය. ප්‍රාර්ථනා කිරීමට හොඳම ක්‍රමය පහත් හඬින් ප්‍රාර්ථනා කිරීමය. මෙය අල් කුර්ආනයේ මෙලෙස සඳහන් වී ඇත. "නුඹලා, නුඹලාගේ පරමාධිපතියාණන්ව යටහත් පහත්ව හා රහසිගතව අමතන්න. නියතවශයෙන්ම අල්ලාහ් සීමාව ඉක්මවන්නන් ප්‍රිය නොකරන්නේය. එමනිසා අල්ලාහ් අල් කුර්ආනයේ නබි සකරියියා (අලෛයිහිස්සලාම්) තුමා පිළිබඳව පවසන විට "ඔහු පහත් හඬින් අල්ලාහ් ඇමතූ විට"යැයි වර්ණනා කරන්නේයග මෙම පිළිවෙතම නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් ආකාරයට පවසා සිටීහග එක් අවස්ථාවක සහාබාවරයෙකු ගමන් කරමින් සිටින විටදී ශබ්ද නගා ඩික්ර් කරමින් සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ "ජනයිනි෴ නුඹලා මධ්‍යස්තව සිටින්න. නුඹලා අමතන්නේ බිහිරි කෙනෙක්ව හෝ ගුප්තව සිටින්නෙක්ව නොව, සෑම දෙයම පැහැදිලිව අසා සිටින ඉතා සමීපව සිටින කෙනෙක්වය. ෂෙහුල් ඉස්ලාම් ඉබ්නු තයිමියියා (රහිමහුල්ලාහ්) තුමා ප්‍රාර්ථනාව පහත් හඬින් නිශ්ශබ්දව කිරීමේ යථාර්තය හා එයින් ඇතිවන ප්‍රතිඵලය පැහැදිලිව ප්‍රකාශ කර සිටී.

"එය ස්ථිර ඊමානයෙහි ලක්ෂණයකි. මෙලෙස අල්ලාහ්ව පහත් හඬින් අමතන ගැත්තා , අල්ලාහ් ඉතා පහත් හඬින් සඳහන් කරන දෑ හා සිතෙහි හටගන්නා සිතුවිලි සියල්ල හඳුනා ගනී යන ස්ථිර විශ්වාසයකින් පසුවන්නේයග සහාබාවරු පහත් හඬින් ප්‍රාර්ථනා කිරීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටියේද එමනිසායත මෙය ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා පවසන විට "පහත් හඬින් කරනු ලබන ප්‍රාර්ථනාව උස් හඬින් කරනු ලබන ප්‍රාර්ථනාවට වඩා හැත්තෑ ගුණයකින් උතුම්ය. තවත් විටෙක ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා මස්ජිදයේ ශබ්දනගා ඩික්ර් කළ පිරිසක් මස්ජිදයෙන් පන්නා දමා "නුඹලාව බිද්අත්වාදීන් ලෙස මා දකින්නෙමි යැයි පැවසූහ.

## 14)8 පාපය නොහොත් තමා කළ වරද පිළිගැනීම

කෙනෙක් තමා කළ අපරාධය හෝ තමා කළ වරද පිළිගැනීම දුආ ප්‍රාර්ථනාවෙහි කොන්දේසි වලින් එකකිග මන්දයත් මෙයද එක් ආකාරයකින් අල්ලාහ් ට සමීප වන මාර්ගයකි.

## 15)පශ්චාත්තාප වී අල්ලාහ්ගෙන් අයැද සිටීම

කෙනෙකු අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහිය, තමා කළ අපරාධයන්, වැරදි සිතට ගෙන කණගාටු වී අල්ලාහ් ගෙන් ඉල්ලීමත් දුආ ප්‍රාර්ථනාවෙහි අනුපිළිවෙලෙහි එක් අංගයකිග මෙම ක්‍රියා කලාපය නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන්ගේ මාර්ගෝපදේශයෙහි දක ගත හැකිය. අයිෂා (රළියල්ලාහු අන්හු) තුමිය වාර්තා කරයිග නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ "අසීරු අවස්ථාවන්වල හෝ පීඩාවන්ට මුහුණ දුන්නේ නම් අල්ලාහ්ගෙන් දුආ ප්‍රාර්ථනා කරයිග පසුව නැවත නැවත දුආ ප්‍රාර්ථනා කරයි. මෙය කෙනෙකු දුආ ප්‍රාර්ථනා කරන විට තම අවශ්‍යතාවය කොතරම් හැඟීම්බරව ඉදිරිපත් කළ යුතුද යන්න අවධාරණය කරයි. මෙවැනි බොහෝ අවස්ථාවන් නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන්ගේ ජීවිතයෙහි දැක ගත හැකිය. නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණන් පෙර පසු සියලු පාපයන් සමා කරනු ලැබූ කෙනෙකු වුවද මෙලෙස ප්‍රාර්ථනා කර ඇත. "යා අල්ලාහ්(පරමාධිපතියාණනි!) මාගේ සියලු පාපයන් සමා කරනු මැනව! මම කලින් කළ එවගේම මින් ඉදිරියට වීමට නියමිත තනියම කළ සාමූහිකව කළ පාපයන් නුඹ මා වෙතින් පාපයක් හෝ වරදක් සේ සළකන සියල්ල සමා කරනු මැනව!" මෙහි නබි (සල්ලල්ලාහු අලෛහි

වසල්ලම්) තුමාණෝ "යා අල්ලාහ්!(පරමාධිපතියාණනී) මාගේ සියලු පාපයන් සමා කරනු මැනව!" යැයි පැවසුවද ප්‍රමාණවත් වේග එය සියල්ල ඇතුළත් කර ගනී. නමුත් නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ එකිනෙක වෙන්වෙන්ව සවිස්තරාත්මකව ඉල්ලීම තුළින් කෙසේ දුආ ප්‍රාර්ථනා කළ යුතුද යන්න මනාව උගන්වා දී ඇතග මෙහි අල්ලාහ් ගෙන් තම පාපයන්, වැරදි සියල්ල සමා කරන ලෙස තරයේ ඉල්ලා සිටින,බැගෑපත්වන එක් ස්ථිර හැඟීමක් ඔහු තුළ දැක ගත හැකිය. නමුත් "යා අල්ලාහ(පරමාධිපතියාණනී) මාගේ සියළු පාපයන් සමා කරනු මැනවයැයි පැවසීමෙන් එම හැඟීම එතුළ අන්තර්ගත නොවේ.

## 16)කෙටියෙන් දුආ ප්‍රාර්ථනා කිරීම

මෙය කෙටියෙන් වගේම සාමාන්‍යයෙන් සියල්ල අන්තර්ගත වන ආකාරයට කරනු ලබන ප්‍රාර්ථනාවන් පිළිබඳ අවධාරණය කරයිග එනම් බොහෝ කරුණු අන්තර්ගත වන අන්දමට පොදු යහපත හා සිදු වුණු, සිදු වීමට ඇති පාපයන් සියල්ලන්ගේ ආරක්ෂාව පතා දෙවිඳුන්ගෙන් පැතීම මෙයින් හැගවේ. මෙය නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාගේ එදිනෙදා ජීවිතයෙහි දැක ගත හැකියග නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ සාමාන්‍යයෙන් "යා අල්ලාහ්!(පරමාධිපතියාණනි!) මා විසින් සිදුවුණු සිදුනොවුණු සියලු පාපයන් සමා කරනු මැනව!"යැයි ප්‍රාර්ථනා කර ඇත.

මෙය මිනිසෙකු විසින් සිදුවුණු නොවුණු පාපයන් හා වැරදි සඳහා කරන පොදු ප්‍රාර්ථනා ක්‍රමයයි.

තවද නබි (සල්ලල්ලාහු අලෛහි වසල්ලම්) තුමාණෝ "යා අල්ලාහ්(පරමාධිපතියාණනි!) මාගේ සියළු පාපයන් සමා කරනු මැනව! මා දැනුවත්ව හා නොදැනුවත්ව කළ, තවද නුඹ මා කෙරෙහි වරදක් ,පවක් සේ සළකන සෑම පාපයක්ම සමා කරනු මැනව මා හිතාමතා කළ සරදමට කළ ,අවබෝධයෙන් හා අනාවබෝධයෙන් කළ සියලු පාපයන් සමා කරනු මැනව! දෙවියනි! මා මෙතෙක් කළ, මා විසින් සිදුවීමට නියමිත, මා රහසිගතව කළ හා ප්‍රසිද්ධියේ කළ, එසේම නුඹ විසින් මාගෙන් වරදක් සේ සළකනු ලබන සියල්ල සමා කරනු මැනව! නුඹමය ආරම්භකයා , අවසානයා හා සියල්ල කෙරෙහි ශක්තිවන්තයා "යැයි ප්‍රාර්ථනා කර ඇත.

1) දුආ ප්‍රාර්ථනාව ආරම්භ කිරීම

කෙනෙකු දුආ ප්‍රාර්ථනා කරන විට තමා වෙනුවෙන් හෝ වෙන කෙනෙකු වෙනුවෙන් කළ හැකිය. මෙය ඔවුනොවුන්ගේ කැමැත්ත මත රදා පවති. නමුත් තමා වෙනුවෙන් ප්‍රථමයෙන් ඇසීම යෝග්‍ය වේ. වේ. මන්දයත් එයට සමහර හේතූන් දක්වා ඇත.

1. කෙනෙකු සියලු යහපත තමාට ලැබිය යුතුයි යන්න ප්‍රිය කරයි එහෙත් වෙනකෙනෙකුට ප්‍රථමයෙන් දුආ කරද්දි එම හැඟීම දිරි ගන්වනු නොලැබේ. වෙන කෙනෙකුට යැයි පටන්ගැනීමේ දී එවැනි පුළුල් අදහස් පහළ වීමද ඉතා දුර්ලභය.
2. මුස්ලිම්වරයෙකු තමා ප්‍රිය කරන දෙයම තම සහෝදර මුස්ලිම්වරයාටත් පැතිය යුතුයි යන හදීසයේ ආකාරයට තමාට පතනා විට තම සහෝදර මුස්ලිම්වරයාටත් පැතීමේ අදහස පහළ වේ.
3. කෙනෙකු ප්‍රථමයෙන් තමා වෙනුවෙන් නොව වෙන කෙනෙකු වෙනුවෙන් දුආ කරන විට එය සත්‍යතාවයෙන් තොර විය හැකිය. ප්‍රථමයෙන් තමා වෙනුවෙනුත් අනතුරුව වෙන කෙනෙකුටත් පතන විට එහි සත්‍යතාවයක් දැකිය හැකිය. මෙම ක්‍රමය අල් කුර්ආනය බොහෝ ස්ථානයන්හි පැහැදිළි කරයි.

අපගේ පරමාධිපතියාණෙනි, අපටද අපට පෙර විශ්වාස වැළදගත් අපගේ සියලුම සහෝදරයින්ද සමාව දෙනු මැනවී. විශ්වාසිකයින් කෙරෙහි අප සිත්තුළ කිසිම ද්වේශයක් ඇති නොකරනු මැනවි. අපගේ පරමාධිපතියාණෙනි, නියතවශයෙන් ඔබ ඉතා දයාන්විතය. අසමසම කරුණාන්විතයා යැයිද කියති.

( සූරා හෂ්ර් 10 )

තවද නුඹගේ වරදට මෙන්ම මුඃමින්වරුන්ගේද මුඃමින්වරින්ගේද වැරදිවලට සමාව අයදිනු. අල්ලාහ් නුඹලාගේ කාර්යබහුලභාවය ගැනද නුඹලාගේ නවාතැන ගැනද දනියි.

( සූරා මුහම්මද් 19 )

(ඔවුහූ කවරෙක් නම්) තමන්ගේ දහම විනෝදය හා කෙළි සෙල්ලම් බවට පත්කර ගත්තාවූ ද ලෞකික ජීවිතය ඔවුන්ව මංමුලා කළාවූද අය වේ.ඔවුන් අපගේ ආයාත් (වදන්) ප්‍රතික්ෂේප කළාක් මෙන්ද මෙදින හමුවීම අමතක කළාක් මෙන්ද අපිද අද දින  ඔවුන්ව අමතක කළෙමු. (යැයි අල්ලාහ් පවසයි)

(සූරා
අ:රාෆ් 51)

මාගේ පරමාධිපතියාණනී, විනිශ්චය කරනු ලබන දිනයේදී මටද මාගේ දෙමාපියන්ටද විශ්වාසිකයිනටද සමාව ලබා දෙනු මැනව.

( සූරා ඉබ්‍රාහිම් 41)

මෙම ක්‍රමය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ එදිනෙදා ජීවිතයේදී දැක ගත හැකිය. උබෙ බින් කෑබ් (රළියල්ලාහු අන්හු) වාර්තා කරයි. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ දුආ ප්‍රාර්ථනා කරන විට වෙනත් පිරිසක් ද මතක් කර ඒ අය වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කරයි. එතුමාණෝ තමාගෙන් දුආ ප්‍රාර්ථනා ව ආරම්භ කරයි.

(අබූ දාවුද්)

මෙය පමණක් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ අඛණ්ඩ ක්‍රමය නොවේ. සමහර අවස්ථාවන් හි තමා වෙනුවෙන් නොව අන් අය වෙනුවෙන් පමණක් ම දුආ ප්‍රාර්ථනා කළ බවට ද බොහෝ සාධක ඇත.

අනස් බින් මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණෝ වාර්තා කරයි. නබි ඉබ්රාහීම් (අලෛහිස්සලාම්) තුමාණන්ගේ බිරිද වන හාජරා තුමිය සම්බන්ධයෙන් කතා කළ අවස්ථාවෙහි අල්ලාහ් ඉස්මායිල් (අලෛහිස් සලාම්) තුමාගේ මවට ආශිර්වාද කරත්වා෧  වැලි එකතු කර සම්සම් ජලය නොවැළක්වා වූවා නම් එය වැවක් වන්නට තිබිණි.

(බුහාරි)

තවද නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ හස්සාන් බින් සාබිත් (රළියල්ලාහු අන්හු) තුමා ගැන පවසද්දි පරමාධිපතියාණනි!

ජිබ්රීල් මගින් ඔහුට උදව් කරනු මැනව! යැයිද ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා ගැන පවසද්දී පරමාධිපතියාණනි! ධර්මයෙහි විග්‍රහ අවබෝධය ඔහුට උගන්වා දෙනු මැනව෴ යැයි ප්‍රාර්ථනා කර ඇත.

ඉහත සඳහන් හදීසයන් සහ මෙවැනි තවත් බොහෝ හදීසයන් තුළින් යමෙක් දුආ ප්‍රාර්ථනා කරන විට තමා වෙනුවෙන් පමණක් නොව වෙන අයට ද දුආ ප්‍රාර්ථනා කළ හැකි බවට සාධකයන්ය. මෙයින් පොදුවේ වෙන අයට වුවද දුආ ප්‍රාර්ථනා කළ හැකි බව මතක තබා ගත යුතුය.

## 17)සියලු මුස්ලිම්වරුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීම

මුස්ලිම්වරයෙකු තමා ප්‍රිය කරන දෙය තම මුස්ලිම් සහෝදරයා වෙනුවෙන්ද ප්‍රිය කිරීම ඊමානය හෙවත් විශ්වාසයේ අංගයකි. මුස්ලිම්වරයෙකු තමාට යහ මඟ පෙන්වන ලෙස, තමාගේ පාපයන් සමා කරන ලෙස පරමාධිපතියාණන්ගෙන් පතන විට තම මුස්ලිම් සහෝදරයා වෙනුවෙන්ද එය පැතිය යුතුය. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මුස්ලිම්වරයෙකු, තමා වෙනුවෙනුත් විශ්වාසවන්ත පිරිමින් සහ කාන්තාවන් වෙනුවෙනුත් අල්ලාහ්ගෙන් පාපක්ෂමාව ඉල්ලා සිටින ලෙස අණ කළේ එම නිසාය. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, කවුරුන් මා වෙනුවෙනුත් විශ්වාසවන්ත පිරිමින් සහ කාන්තාවන් වෙනුවෙනුත් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේද එම යහපත ඔහුටත් විශ්වාසවන්ත පිරිමින් සහ කාන්තාවන්ටත් සටහන් වන බව ප්‍රකාශ කරයි.

මෙම හදීසය මුස්ලිම්වරයෙකු ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි තම සෙසු මුස්ලිම් සහෝදර සහෝදරියන් හා මුස්ලිම් සමාජය වෙනුවෙන් ම ප්‍රාර්ථනා කළ යුතුය යන්න පිළිඹිබු කරයි. තවද ඔහු ඉස්ලාමයේ සතුරන්ට එරෙහිවද දුෂ්ඨ පාලකයාට එරෙහිවද මුස්ලිම්වරුන්ට වද හිංසා පමුණුවන මුස්ලිම් නොවන දුෂ්ඨ රජුට එරෙහිවද දුආ ප්‍රාර්ථනා කිරීම අනිවාර්යවේ. මේ සියල්ල ඊමානයේ ලක්ෂණ හා දුආ ප්‍රාර්ථනාවෙහි පිළිවෙළ වේ.

තවද කෙනෙකු, තම දෙමාපියන් ජීවතුන් අතර සිටියද නොසිටියද ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම ඉතා අත්‍යාවශ්‍ය වේ.

විශ්වාසවන්තයින් වෙත අල්ලාහ් පහත සඳහන් ලෙස  උපදෙස් ලබා දෙන්නේය.

බනූ ඉස්රායීල් 24

## 18)ආමීන් පැවසීම

"ආමීන්" යන පදය භාවිතය මෙයට පෙර කිසිම සමාජයකට නොලැබුනකි. මුස්ලිම් සමාජයට පමණක් විශේෂයෙන් ලැබුන එකකි. මෙය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූ පහත හදීසයෙන් අවබෝධ කරගත හැකිය. යුදෙව්වන් නුඹලා ආමීන් පැවසීම හා එකිනෙකා අතර සලාම් පැවසීම දැක ඊර්ෂ්‍යා වන තරම් වෙන කිසිවකට ඊර්ෂ්‍යා නොකරන්නේය.

ආමීන් පැවසීමේ අරමුණ වන්නේ බොහෝවිට දුආ ප්‍රාර්ථනාව අසන පුද්ගලයාගේ ප්‍රාර්ථනාව පිළිගැනීමට හෝ පිළිතුරු ලැබීමට ඇති අවකාශය වැඩි කර ගැනීමයගතවද ආමීන් පැවසීම උක්ත ප්‍රාර්ථනාව නැවත නැවත ආවර්ජනය  කිරීමක් වැනිය. මෙයට අමතරව කෙනෙකු අසන ප්‍රාර්ථනාවන් සියල්ලෙහි හරය ආමීන් යන මෙම වදන තුළ අන්තර්ගත වේග සමස්ථයක් ලෙස දුආ ප්‍රාර්ථනාව බලන කල්හි පෞද්ගලිකව කළ යුතු සහ සාමූහිකව කළ යුතු ඒවා වශයෙන් දැක ගත හැකිය. උදාහරණ වශයෙන් උදෑසන හා සන්ද්‍යා කාලයේ දී ඇති ප්‍රාර්ථනාවන් හා දවසේ එක් එක් අවස්ථාවන් සඳහා වූ අවස්ථා දුආවන් පෞද්ගලිකව කළ යුතු ඒවායග එවගේම නිවසට ඇතුළුවන විට කරන දුආව හා පස්වේල සලාතයෙන් පසු ප්‍රාර්ථනා කරන දුආව සාමූහිකව ඇසීම බිද්අත් වේග නමුත් සලාතයේ කුනූත් හි අසනු ලබන දුආවන් අසන විට සියළු දෙනාම ආමීන් පැවසිය යුතුය. එවගේම සූරා ෆාතිහා පාරායණා කිරීමෙන් අනතුරුව ආමීන් පැවසිය යුතුය. කෙනෙකු සලාතයේ දී හෝ සලාතයෙන් පිටත හෝ ඉමාම් ලෙස හෝ මඃමූම් ලෙස හෝ සූරා ෆාතිහාව පාරායණා කරන සෑම අවස්ථාවකම ආමීන් පැවසිය යුතුය.

යමෙකු ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි තමාටම ආමීන් පැවසිය යුතුද? නැද්ද? යන්නෙහි මතභේදයන් දැකිය හැකිය. නමුත් යම් දුආවකට පසුව ආමීන් පැවසීමේ නීතිය වලංගු වන්නේ ප්‍රාර්ථනා කරන්නාට  හෝ ශ්‍රවණය කරන්නා ට යැයි නිශ්චිත නොකර සඳහන්ව ඇත.  ආමීන්

පැවසීම යන කාරණාව පොදුවේ සඳහන් ව ඇති බැවින් කෙනෙකු තමාටම ආමීන් පැවසීම අවසර ලද්දකි.

## 19)කාව්‍යමය ස්වරූපයෙන් ප්‍රාර්ථනා කිරීම.

එනම් යමෙක් ප්‍රාර්ථනා කරන විට කාව්‍යාලංකාරයෙන් යුත් අනුප්‍රාසමය වදන් භාවිතා කොට ප්‍රාර්ථනා කිරීම මෙයින් අදහස්වේ. ඇත්තෙන්ම මෙය ප්‍රාර්ථනාවෙහි අත්‍යාවශ්‍ය නොවන ක්‍රියා කලාපයකිග කෙනෙකු සීමාව ඉක්මවූ වචන භාවිතා නොකරන්නෙකු මෙන්ම එවන් වූ වදන් ස්වාභාවයෙන්ම භාවිතා කරන්නෙකු වේ නම් එසේ ප්‍රාර්ථනා කිරීම වැරද්දක් නොවේග මන්දයත් නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පවා මෙවැනි ආකාරයට දුආ ප්‍රාර්ථනා කර ඇත.

## 20)දුආ ප්‍රාර්ථනාවෙහි සීමා මායිම් ඉක්මවා යෑම.

දුආ ප්‍රාර්ථනාව සීමා මායිම්වලින් සමන්විතයග එම මායිම් තුළ සිටීමට වගබලාගත යුතුය. අල්ලාහ් ශුද්ධ වූ අල් කුර්ආනයෙහි මෙසේ සඳහන් කරයිග නුඹලා තැන්පත්භාවයෙන් හා නිහඬ ව නුඹලාගේ පරමාධිපතියාණන් අමතන්නග නියතවශයෙන්ම අල්ලාහ් සීමා මයිම් ඉක්මවන්නන් ප්‍රිය නොකරන්නේය.

පුද්ගලයෙකු තමා කරනා ප්‍රාර්ථනාවන් මගින් සීමා මායිම් ඉක්මවා යන්නේය .උදාහරණ වශයෙන් වළක්වන ලද යමක් ප්‍රාර්ථනා කිරීම, වළක්වන ලද යමක් මෙලොව යහපත වෙනුවෙන් හෝ පරලොව යහපත වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම, සීමා මායිම් ඉක්මවා කටයුතු කිරීමේ උච්චතම අවස්ථාවකි . පුද්ගලයෙකු අල්ලාහ් ඉදිරියේදි තමාගේ තත්වය හා තරාතිරම හඳුනාගත යුතුය. එවගේම අල්ලාහ් විසින් මවන ලද සියලුම දේවල්වලට වඩා තමාව උසස් කර ඇත යන්නත් අනෙකුත් ඒවාට කළ නොහැකි දේවල් පවා තමාට කිරීමට අනුමැතිය ලබා දී ඇත යන්නත් අවධාරණය කර ගත යුතුය.

## 21)පිළිතුර බලාපොරොත්තු නොවීම.

මෙය දුආවෙහි අන්තර්ගත වන කොටසකිග බොහෝ පිරිස්, තමාගේ ප්‍රාර්ථනාවන්ට අල්ලාහ් පිළිතුරු ලබා නොදුන්නේය යන වැරදි

අදහසින් පසු වෙතිග සමහරවිට මෙවැනි අදහස් ම ඔහුගේ ප්‍රාර්ථනාවන් ප්‍රතික්ෂේප වීමට හේතුවන්නේය.

කෙනෙකු අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනාවන් හි ප්‍රතිඵලයක් ලෙස අල්ලාහ් කුමන හෝ ආකාරයට පිළිතුරු ලබා දෙන්නේය, ඉතා හොඳ ප්‍රතිඵලයක් ලබාදෙන්නේය යැයි අපේක්ෂා කිරීම විශ්වාසයේ එක් අංගයකිග මන්දයත් අල්ලාහ් කරුණාවන්ත හා ඉතා දයාවන්තය.

සුෆියාන් බින් උයෙයිනා ලස්සන වදනක් ප්‍රකාශ කරයි. එනම් නුඹලාගෙන් කෙනෙක් තමාගේ පාපයන් නිසා අල්ලාහ් තමාගේ ප්‍රාර්ථනාවන් ප්‍රතික්ෂේප කරයි යැයි කවුරුත්ම නොසිතන්න. නියතවශයෙන්ම අල්ලාහ් ඔහුගේ ඉතා පහත් මැවීමක් වන ඉබ්ලීස්ගේ ප්‍රාර්ථනාවට පිළිතුරු ලබා දී ඇත. (අල්ලාහ් ඔහුට ශාප කරත්වා!) ඔහු අල්ලාහ්ගෙන් යා අල්ලාහ් කියාමත් දිනය දක්වා මට අවකාශයක් ලබා දෙනු මැනව! යැයි ඉල්ලා සිටි අවස්ථාවෙහි නුඹ කියාමත් දිනය තෙක් අවකාශය ලැබ ඇත යැයි පවසා ඔහුට පිළිතුරු ලබා දී ඇත. එසේනම් නියතවශයෙන්ම ඔහුගේ ප්‍රාර්ථනාවට වඩා පාපියෙකුගේ ප්‍රාර්ථනාව අයිතිවාසිකමෙන් යුක්තය.

## 22)දුආ ප්‍රාර්ථනා අවස්ථාවෙහි ඉහළ බැලීම

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ සලාතයේ ප්‍රාර්ථනා කළ අවස්ථාවෙහි කෙනෙකු තම බැල්ම ඉහල හෙළීම වළක්වා ඇත. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ සලාතයේ ප්‍රාර්ථනා කළ අවස්ථාවෙහි තම බැල්ම ඉහළ හෙළීමෙන් වළක්වා ගත යුතුයි නැතහොත් ඔහුගේ බැල්ම අහිමි වේවා යැයි අවවාද ඇත.

(මුස්ලිම්)

මන්දයත් අහස දෙසට තම ඔලුව ඔසවන අවස්ථාවෙහි එහිදි අපේක්ෂා කරනු ලබන තැන්පත්භාවය ලබා නොගන්නේය යන හේතුව නිසාවෙනි.

## 23)සජ්දා කරන විට ප්‍රාර්ථනා කිරීම

කෙනෙකුගේ සලාතයේ ඉතා ගෞරවණීය, උසස් අවස්ථාව හෝ ස්ථානය සුජූද් හෙවත් සජ්දා කරන අවස්ථාව යි සුජූද ය අවනතභාවය ගෙනහැරපාන්නකි. මිනිසෙක් තමාගේ ඉතාමත් වැදගත් උසස්

අවයවයක් වන නිසා, දේව සහයෝගය, දේව දයාව අපේක්ෂාවෙන් පොළොව මත තබන්නේ නම් එම අවස්ථාව අගනා එකක් නොවන්නේ කෙසේද? අල්ලාහ් මෙම අවස්ථාව ඉතා ප්‍රියකරන්නේ ද එම නිසාය. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව අබූ හුරෙරා (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි ගැත්තෙකු සුජූද් කරන අවස්ථාවෙහි අල්ලාහ් ඉතා සමිපව සිටින්නේය. එමනිසා සුජූද් කරන අවස්ථාවෙහි ප්‍රාර්ථනාවන් වැඩිකර ගන්න යැයි පවසූහ.

## 24)සලාතය අවසන් කිරීමට පෙර දුආ ප්‍රාර්ථනා කිරීම

කෙනෙකු සලාතයේ අවසන් අත්තහියියාත් ප්‍රකාශයෙන් පසුව සලාම් දීමට පෙර ඇති අවස්ථාවත් දුආ ප්‍රර්ථනාවන් පිළිගැනීමට ඇති අවස්ථාවක් බැවින් ඔහු කැමැති දේවල් එම අවස්ථාවෙහි පැතිය යුතුයි. ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයිග දිනක් මම සලාතයේ නියළෙමින් සිටියෙමි. එම අවස්ථාවෙහි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, අබූ බක්ර්, උමර්(රළායල්ලාහු අන්හුමා) වැනි අයද සිටියහ. මම සලාතයේ අවසන් අත්තහියියාත් ප්‍රකාශයෙන් පසුව අල්ලාහ්ව ප්‍රශංසා කොට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට සලවාත් පවසා ප්‍රාර්ථනා කිරීමට පටන්ගත්තෙමි. එවිට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, ප්‍රාර්ථනා කරන්න පිළිතුරු ලැබේවි, නුඹලා අල්ලාහ්ගෙන් අසන්න නුඹලාට පිළිතුරු ලැබේවි යැයි පැවසූහ.

## 25)සලාතයෙන් පසුව දුආ ප්‍රාර්ථනා කිරීම

සලාතයෙන් පසුව කරනු ලබන ප්‍රාර්ථනාවන් පිළිගනු ලැබේ යනුවෙන් බොහෝ හදීසයන් සාදකයන් ලෙස දැකිය හැකිය. "අබූ උමාමා අල් බාහිලී (රළියල්ලාහු අන්හු) නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන්, අල්ලාහ්ගේ දූතයාණනි෴ අධිකව පිළිතුරු ලැබෙන්නේ කුමන ප්‍රාර්ථනාවටද? යැයි විමසූහ. එවිට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, රාත්‍රියෙහි අවසන් කොටසෙහි හා ෆර්ල් සලාතයෙන් පසුව කරනු ලබන ප්‍රාර්ථනාවන් හි යැයි පිළිතුරු දුන්හ.
(තිර්මිදි)

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, මෙම වේලාව, තමා ඉතා ප්‍රියකරන වේලාවක් බව මුආද් බින් ජබල් (රළියල්ලාහු අන්හු)

තුමාට ප්‍රකාශ කර ඇත. "මුආද්! අල්ලාහ් මත දිවුරා කියන්නෙමි මම නුඹව ප්‍රිය කරන්නෙමි. එමනිසා සෑම සලාතයකට පසුවම පරමාධිපතියාණනි‍ෟ ඔබව සිහිපත් කිරීමට, ඔබට ප්‍රශංසා කිරීමට, ඔබ වෙනුවෙන්ම නැමදීමට මට උදව් කරනු මැනව‍ෟ යැයි පවසන ලෙස පැවසූහ.

(අබූ දාවුද්)

ඉහත හදීසයේ සඳහන් ෆර්ල් සලාතයෙන් පසු යන වදන පිළිබඳ විද්වතුන් අතර මතභේද දැකිය හැකිය. මෙහි පසු යන තේරුම හිමි අරාබි පදය ඇඟවීමට දුබුර යන පදය භාවිතා කර ඇතග ෂෙහුල් ඉස්ලාම් ඉබ්නු තයිමියියා (රහිමහුල්ලාහ්) තුමා මෙම හදීසයේ අර්ථය මූලික කරගෙන පහත සඳහන් ආකාරයට පවසයිග එනම් "හදීසයේ සඳහන් ආකරයට දුබුර යන වචනය කෙනෙකු සලාතයෙහි පාරායණා කළ යුතු සියල්ල පාරායණා කර සලාම් දීමට පෙර ඇති අවස්ථාවත්, අත්තහියියාත් පවසා සලාම් දීමෙන් පසුව ඇති අවස්ථාවත් යන දෙකම හඟවයිග එමනිසා මෙම හදීසයේ ඇති දුබුර යන වචනයට පසුව ලෙස පරිවර්තනය නොකර අවසානයේ ලෙස පරිවර්තනය කිරීම ඉතා ඔබ්නේය" යනුවෙනි.

නමුත් වෙනත් හදීස්වල සලාතය සම්පූර්ණයෙන් අවසන් වීමෙන් අනතුරුව ප්‍රාර්ථනා කිරීම ලෙස සඳහන් ඇත එවගේම උක්ත දුබුර යන වචනය ඉමාම් ඉබ්නු තයිමියියා (රහිමහුල්ලාහ්) පවසන අන්දමට අවස්ථා දෙකටම ගැළපෙන්නේය යැයි (සාදුල් මආද්) ප්‍රකාශ කර සිටියි.

## 26)සිකුරාදා දින ජුම්ආ දවසේ ප්‍රාර්ථනා කිරීම

සිකුරාදා දිනයන්හි එක් වේලාවක් ඇත. එම වේලාවෙහි කරනු ලබන ප්‍රාර්ථනාවන් පිළිගැනෙනා අතර ඒ සඳහා අල්ලාහ්ගෙන් පිළිතුරු ද ලැබේ. මෙය අනෙකුත් දවස්වලට වඩා සිකුරාදා දිනය වෙනුවෙන් අල්ලාහ් ලබා දුන් ගෞරවයකි.

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයs. "සිකුරාදා දිනයන්හි එක්තරා වේලාවක් ඇතග එම වේලාවෙහි යමෙකු අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේ නම් නියතවශයෙන්ම අල්ලාහ්

ඔහුගේ ප්‍රාර්ථනාවන්ට පිළිතුරු ලබා දෙන්නේය. අනතුරුව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ, තම අත පෙන්වා එය ඉතා කෙටි වේලාවකි යන්න අඟවා සිටියේය. ඉහත ආකාරයට හදීසය මූලික කරගෙන උක්ත වේලාව කුමක්ද යන්නෙහි බොහෝ මතභේද දැකිය හැකියග නමුත් එයින් මත දෙකක ඉතා ස්ථිර භාවයක් දැකිය හැකිය.

ඉමාම් කුත්බා දේශනය කරන අවස්ථාවෙහි කුත්බා දේශන දෙක අතර ඉමාම් වාඩිවන වේලාව පටන් ජුම්ආව අවසන්වන තුරු ඇති වේලාව සහ අසර් සලාතයෙන් පසුව මඃරිබ් වන තෙක් ඇති වේලාවයි. ඉමාම් ඉබ්නුල් කයියූම් (රහිමහුල්ලාහ්) පළමු වේලාවට වඩා දෙවෙනි වේලාව පෙන්වා දෙයි. (සාදුල් මුආද්) මෙය පහත සඳහන් හදීසය මූලික කරගෙන පෙන්වා දෙන්නේය .
සිකුරාදා දිනයන්හි පැය දොළහෙන් පැයක් ඇත එම පැයෙහි ඕනෑම මුස්ලිම්වරයෙකු කුමන දේ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේද එය අල්ලාහ් අනිවාර්යෙන්ම ලබා දෙන්නේය . එමනිසා එම වේලාව අසර් වේලාවෙහි අවසානයට ඇති වේලාවෙහි සොයාගන්නග (අබූ දාවුද්) සහාබාවරු ඇතුලු බහුතරයකගේ අදහසද මෙයමය.

## 27)රාත්‍රියෙහි ඇහැරි ප්‍රාර්ථනා කිරීමග

කෙනෙකු මධ්‍යම රාත්‍රියෙහි ඇහැරී අල්ලාහ් සිහිපත්කර ඔහුගෙන් යමක් ප්‍රාර්ථනා කරන්නේ නම් අල්ලාහ් ඔහුගේ ප්‍රාර්ථනාව පිළි ගන්නේය. "කවුරුන් රාත්‍රියෙහි අවදිවී ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂයිඉන් කදීර්ල අල් හම්දු ලිල්ලාහ් වසුබ්හානල්ලාහ් වල් හම්දු ලිල්ලාහ් ලා ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් වලා හව්ල් වලා කුව්වත ඉල්ලා බිල්ලාහ් යැයි පවසා පරමාධිපතියාණනි ! මාව කමා කරනු මැනවෟ යනුවෙන් අඛණ්ඩව දුආ ප්‍රාර්ථනා කරන්නේද, ඔහු පිළිතුරු ලබන්නෙකුයග තවද යමෙකු වුළුඃ දෝවණය කර නැමඳුමෙහි යෙදී පරමාධිපතිගෙන් ප්‍රාර්ථනා කරන්නේද එය පිළිගැනෙන්නේය යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ.

## 28)කෙනෙකුගේ මරණාසන්න මොහොතක ප්‍රාර්ථනා කිරීම

මෙම භයංකාර මොහොතේ, පුද්ගලයෙක් තම ජීවිතයෙහි අවසන් මොහොතෙහි සිටින බැවින් ඔහු අසළ සිටින ඕනෑම කෙනෙකු ප්‍රාර්ථනා

කරන්නේ යහපතමයග එමනිසා එහි ප්‍රාණය ලබාගැනීමට පැමිණි මලක්වරු ප්‍රාර්ථනා කරනු ලබන සියල්ලමට ආමීන් පවසමින් සිටිති.

උම්මු සලමා (රළියල්ලාහු අන්හා) තුමිය දන්වයි. අබූ සලමාගේ මරණාසන්න මොහොතේ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ඔහු අසලට පැමිණියේය. එවිට ඔහුගේ බැල්ම ඒකාකාරව තිබිණි. (එනම් මරණයට පත් වූ බැවින් ඇස් එක් දිසාවකට යොමුවී විවෘතව තිබිණි) නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්තුමාණෝ ඔහුගේ ඇස් වසා "පුද්ගලයකුගේ ප්‍රාණය වෙන් වෙනවාත් සමඟම ඔහුගේ බැල්ම එම ප්‍රාණය දෙසට යොමුවන්නේය යැයි පැවසූහ. එය අසා රැස්ව සිටි පිරිස අඬන්නට පටන් ගත්හ එවිට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ නුඹලා යහපත පමණක් ම ප්‍රාර්ථනා කරන්න. නුඹලා කරන ප්‍රාර්ථනාවන්ට මලාඉකාවරු ආමීන් පවසති . යැයි පවසා පරමාධිපතියාණනි! අබූ සලමාගේ පාපයන් සමා කරනු මැනවා යැයි ප්‍රාර්ථනා කළහ.

එමනිසා මරණාසන්න මොහොතක සිටින කෙනෙකු අසලට ගිය විටෙක සියලු යහපත ඔහු වෙනුවෙන් හා ඔහුගේ පවුල වෙනුවෙන්ද තමා වෙනුවෙන්ද ප්‍රාර්ථනා කළ යුතුය.

තවද මෙම හදීසය කෙනෙකු මරණයට පත්වන මොහොතේ ඔහුගේ ප්‍රාණය දෙස බැල්ම යොමුවන බව ද පැහැදිලි කර ඇත.

## 29) කුකුළා හඬලන විට ප්‍රාර්ථනා කිරීම

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූ බව අබූහුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා පවසයි. "නුඹලා කුකුළා හඬලන ශබ්දය ඇසුවේ නම් අල්ලාහ්ගෙන් ඔහුගේ දයාව, කරුණාව ප්‍රාර්ථනා කරන්න. එවුන් මලාඉකාවරුන් දැක ඇත. තවද බූරුවන් කෑගසනඬ ඇසුණු විට අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතන්න; මන්ද යත් එවුන් ශෛතාන් දැක ඇත.

## 30) අල් කුර්ආන් පාරායණයෙන් පසු ප්‍රාර්ථනා කිරීම

කෙනෙකු අල් කුර්ආනය පාරායණය කරන අවස්ථාවෙහි ඔහු වෙත ශාන්තිය හා සන්සුන්භාවය පහළවන්නේය. එවගේම මලාඉකාවරුන්ද පහළවන්නේය. අල් කුර්ආන් පාරායණා කිරීමෙන් අනතුරුව දුආ කරන

ලෙස අප දිරිගැනෙන්නේ එමනිසාය මන්දයත් මෙය ප්‍රාර්ථනා පිළිගැනෙන්නට උචිත වේලාවකි.

## 31)කෙනෙකු නොමැති අවස්ථාවෙහි ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම

අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කරයි. "මුස්ලිම්වරයෙකු තම සහෝදර මුස්ලිම්වරයා නොමැති අවස්ථාවෙහි ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන විට මලක්වරයෙක් පරමාධිපතියාණනි! මෙම පුද්ගලයා ඔහුගේ සහෝදරයා වෙනුවෙන් ප්‍රාර්ථනා කළ ආකාරයට ඔහුටත් ලබා දෙනු මැනව! යැයි ප්‍රාර්ථනා කරන බව" නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ.

## 32)දුආ ප්‍රාර්ථනාව වෙනුවෙන් තවත් ක්‍රම කිහිපයක්

කෙනෙක් ප්‍රාර්ථනා කරන විට පෙර කොන්දේසි හා ඉහත සඳහන් කළ විනය මාලා සම්පූර්ණ කරගත යුතුය. විශේෂයෙන්ම අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන බව සිහිතබා ගත යුතුය. ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි සිත එක්තැන් කළ යුතුය. එවගේම ප්‍රාර්ථනාව පිළිගැනෙන වේලාවන්හි ප්‍රාර්ථනා කළ යුතුය.

## 33)දුආ ප්‍රාර්ථනාව සඳහා වූ වැදගත් ක්‍රම සහ විධි

1. ගැතිභාවය නියෝජනය වන අන්දමට ප්‍රාර්ථනා කිරීම, අල්ලාහ් ශුද්ධ වූ අල් කුර්ආනයෙහි "නුඹලා නුඹලාගේ පරමාධිපතිගෙන් පාපක්ෂමාව ඉල්ලා සිටින්න" යනුවෙන් සඳහන් කරයි.
2. අල්ලාහ් නොවන වෙන කෙනෙකුගෙන් ප්‍රාර්ථනා කිරීම නුසුදුසුයග පාපක්ෂමාව වුවද, තම අවශ්‍යතාවයක් වුවද, ආරක්ෂාව වුවද, ප්‍රාර්ථනා කර ඉල්ලා සිටිය යුත්තේ අල්ලාහ්ගෙන් පමණි.
3. කෙනෙකු තම ප්‍රාර්ථනාව පිළිගැනේ යන ස්ථිර විශ්වාසයෙන් යුතුව කළ සිදු කළ යුතුය. නුඹලා නොඉවසීමෙන් මම අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළෙමි,නමුත් ඒවා ප්‍රතික්ෂේප වුණි යනුවෙන් පවසන්නේ නැතිව සිටියහොත් නුඹලා සියළුදෙනාගේ ම දුආවන් නියතවශයෙන්ම පිළිගැනේවි" යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

4. දුආ ප්‍රාර්ථනා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ සිත සන්සුන්ව තබා ගැනීමය "දැනගන්න, නොසැලකිලිමත් සිත් ඇත්තවුන්ගේ දුආ ප්‍රාර්ථනාවන්ට අල්ලාහ් පිළිතුරු ලබා නොදෙන්නේය. යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ. (තිර්මිදි) එමනිසා දුආ ප්‍රාර්ථනා කරන්නාගේ සිත ගෞරවයෙන් හා හැඟීම්වලින් පිරී තිබිය යුතුය.

5. දුආ ප්‍රාර්ථනා කරන විට ප්‍රාර්ථනාවන් පිළිගැනෙන වේලාවන් තෝරා ගත යුතුය. උදාහරණ වශයෙන් ෆජ්රයට පෙර ඇති වේලාව, ජුම්ආ දවසෙහි දහවලෙහි අවසන් වේලාව, වර්ෂාව පතිත වන විට, අදානයත් ඉකාමතයත් අතර ඇති වේලාව, ස්ථානයන් අතුරින් ඉතා උසස් ස්ථානය වන මස්ජිදය තුළ, මස්ජිදුල් හරාම් වැනි ස්ථාන යනාදිය සඳහන් කළ හැකිය. පොදුවේ සෑම වේලාවකම දුආ ප්‍රාර්ථනාවන් පිළිගැනෙනු ඇත යන්න මතකයේ තබා ගත යුතුය.

6. "නුඹලාගෙන් කෙනෙක් දුආ ප්‍රාර්ථනා කරන්නේ නම් ප්‍රථමයෙන් අල්ලාහ් ව ප්‍රශංසා කළ යුතුය. අනතුරුව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට සලවාත් පැවසිය යුතුය, පසුව ඔහුගේ අවශ්‍යතාව අල්ලාහ් ඉදිරියෙහි ඉදිරිපත් කළ යුතුය යනුවෙන් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසූහ.

7. දුආව ප්‍රාර්ථනය ආරම්භ කරන විට "බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්"යැයි පවසා ආරම්භ කළ යුතුය. "බිස්මිලය" මගින් ආරම්භ නොවුණ දුආ ප්‍රතිකෙෂ්ප වනු ඇතග කෙනෙකු අල්ලාහ්ගේ නාමය සඳහන් කර ඔහු කෙරෙහි සම්පූර්ණ විශ්වාසයෙන් හා අපේක්ෂාවෙන් යුතුව ප්‍රාර්ථනා කරන්නේ නම් එම ප්‍රාර්ථනාව ප්‍රතික්ෂේප නොකරනු ලැබේ යන ස්ථාවරයෙන් ආරම්භ කළ යුතු අතර නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ හට සලවාත් පැවසිය යුතුය.

8. ප්‍රාර්ථනා කිරීමේ දී පිරිසිදුවී කිබ්ලාව පෙරටු කරගෙන දෑත් ඔසවා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුය. (මෙය වාජිබ් වේග අත්‍යාවශ්‍ය නොවේග නමුත් අනුගමනය කිරීම උතුම්ය.

9. කෙනෙකු කරන්නා වූ ප්‍රාර්ථනාව ප්‍රතිකෙෂ්ප වීමට හේතුව ඔහු අල්ලාහ් වළක්වා ඇති යමක් කර තිබීම විය හැකියග උදාහරණ වශයෙන් ආහාරපාන, ඇඳුම්, නවාතැන්, ගමන්බිමන් යනාදිය

හරාම් ආකාරයට ලබාගෙන තිබීම විය හැකියග නැතහොත් හරාම් ආකාරයට තම ජීවන මාර්ගය සකසා තිබීම විය හැකිය. නැතහොත් අඛණ්ඩව පාපයන් කරන කෙනෙකු විය හැකිය. නැතහොත් ධර්මයෙහි අනුමත නොකෙරුණු බිද්අතයන් කරන කෙනෙකු විය හැකිය. නැතහොත් ප්‍රාර්ථනා කරන්නා අල්ලාහ් දෙස තමාව යොමු කිරීමෙහිලා අධෛර්යවන්තයෙකු (ඊමානයේ ස්ථිරභාවය රහිත කෙනෙකු) විය හැකිය.

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙලෙස පැවසූහ.
ජුම්ආ සලාතයට යන්නන් කොටස් තුනකි.

1. ජුම්ආව වෙනුවෙන් මස්ජිදයට ගොස් කුත්බා දේශනය පැවැත්වෙන අවස්ථාවෙහි කතා කරමින් සිටින පිරිස වේග එහිදි ලබාගන්නා ඵලය එයම වේ.
2. ජුම්ආව වෙනුවෙන් ගොස් එහි ප්‍රාර්ථනා කරයිග ඔහු ප්‍රාර්ථනා කළ දෙය අල්ලාහ් සමහර විට ලබා දෙයි නැතහොත් ලබා නොදෙයි.
3. ජුම්ආව වෙනුවෙන් ගොස් අන් අයව ඈත් කරගෙන ඉදිරියට නොයමින් සෙසු මුස්ලිම්වරුනට අවහිර නොකර වාඩි වී එහි කියනු ලබන සියළු දෑ නිහඬව අසා සිටින පිරිස වේග මෙවැනි අයට මෙම ජුම්ආ දවසේ සිට ඊළග ජුම්ආව වන තෙක් හා අමතරව තව දින තුනක් (දින දහයක්) තමා විසින් ඉටුවුණ පාපයන් සඳහා අල්ලාහ් ලග පාපක්ෂමාව ඇත.

## 34) අවසානය වශයෙන්

ඉබ්නුල් කයියූම් (රහිමහුල්ලාහ්) පවසයිථ පුද්ගලයෙක් කරන ප්‍රාර්ථනාව පහත කරුණු සමඟ සැසඳේ නම් එම ප්‍රාර්ථනාව නියතවශයෙන්ම ප්‍රතික්ෂේප නොකරනු ලැබේ. එනම් කෙනෙකු තමා ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි සිතට එකඟවත් දුආ පිළිගැනෙන වේලාව යැයි විශේෂ කර පෙන්වා ඇති වේලාවන් වලදීත් බැතිභාවයෙන් පිරි සිතෙන් අල්ලාහ් ඉදිරියෙහි තමාව බැගෑපත් කරගෙන වුළුඃ සමග කිබ්ලාව පෙරටු කරගෙන දෑත් ඔසවා අල්ලාහ්ව

ප්‍රශංසා කොට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට සලවාත් පවසා තමා කළ පාපයන් වෙනුවෙන් කණගාටු (දුක්) වී අල්ලාහ් තමාව පිළිගනී යන අධිෂ්ඨානයෙන් දේව භියබැතිභාවයෙන් හා අපේක්ෂාවෙන් යුතුව ප්‍රාර්ථනා කළ යුතුය.

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහග කෙනෙකු සිතට එකඟව ප්‍රාර්ථනාවක් කරයි නම් එය පිළිතුරු ලැබෙන ප්‍රාර්ථනාවකි

## 35)භක්ති වැඩියෙන් ඇත්තවුන්ගෙන් දුආ ප්‍රාර්ථනා කරන මෙන් ඉල්ලා සිටීම,

තමාට වඩා වැඩියෙන් ඉබාදතයන් කරන, වැඩි භක්තිකයෙකුගෙන් තමා වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කරන ලෙස ඉල්ලා සිටීම අනුමැතිය ලද්දකි. මේ ආකාරයට නිශ්චිත කෙනෙකු වෙත ගොස් උදාහරණයක් වශයෙන් මාගේ පුතාගේ මෙන්න මේ අසනීපය සුව වෙන්න ප්‍රාර්ථනා කරන්න ලෙස ඉල්ලා සිටීම දැක්විය හැකිය. සෆ්වාන් බින් අබ්දිල්ලාහ් (රළියල්ලාහු අන්හු ) තුමා මෙසේ පවසයි. "මම සිරියාවට ගොස් අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමාව එතුමාගේ නිවසෙහි බැහැ දැක්කෙම්ග එවිට උම්මු දර්දා (රළියල්ලාහු අන්හා) තුමිය මාගෙන් ඔබ මෙවර හජ් කර්තව්‍ය ඉටුකිරීමට යන්නෙහිද? යැයි විමසුවායග එයට මම ඔව් යැයි පිළිතුරු දුන්නෙමි. අනතුරුව අපගේ යහපත වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කරන ලෙස ඉල්ලා සිටියාය
කෙනෙකු ආගමෙහි අනුමැතිය නොලත් යමකින් වසීලා සෙවීම බිද්අත් වේග එවගේම අද බහුලව දැකිය හැකි ක්‍රමය වන නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් වසීලා සෙවීම හා අල් කුර්ආන් සුන්නා මගින් වසීලා සෙවීම අවසර නොලද්දකි . නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ සියළු දෙනාම ප්‍රිය කරන කෙනෙක් වන අතර සියළු දෙනා විසින් ප්‍රිය කල යුතු කෙනෙකි යන්නෙහි කිසිදු සැකයක් නොමැත. ඔහු මැවීම් අතරින් ශ්‍රේෂ්ඨතම පුද්ගලයාය. මනුෂ්‍ය සංහතියටම ආදර්ශමත් කෙනෙකි. මෙලොව හා පරලොව අපගේ නායකයාය. ඔහුව අල්ලාහ්ගේ තත්වයට කිසිවිටෙක උසස් කළ නොහැකියග අල්ලාහ් ම ඔහුව නබි වරයෙක් ලෙස තෝරා ගත්තේය එතුමා එය පිළිගත්තා හැරෙන්නට වෙන කිසි දෙයක් නොමැත.

## 36) දුආ ප්‍රාර්ථනාව උදෙසා ජීවතුන් අතර සිටින කෙනෙකුගෙන් වසීලා සෙවීම.

ජීවතුන් අතර සිටින පුද්ගලයෙක් සාධාරණව කටයුතු කරන සත්‍යවන්ත පුද්ගලයෙකු ලෙස දකින කළ ඔහුගෙන් වසීලා සෙවීම අනුමැති ලද්දකි .
මුස්ලිම්වරයෙකු තම සහෝදර මුස්ලිම්වරයා වෙනුවෙන් ඔහු නොමැති අවස්ථාවෙහි ප්‍රාර්ථනා කරන විට එම ප්‍රාර්ථනාව පිළිගැනෙන අතර මලක්වරයෙක් ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙසට නියම කරනු ලැබ තිබේ. එම මලක්වරයා ප්‍රාර්ථනා කරන පුද්ගලයා වෙනුවෙන් යහපත අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරයි. එනම් ඔහුගේ ප්‍රාර්ථනාවට ආමීන් පවසා අල්ලාහ්ගෙන් මොහුටත් යහපත ලබා දෙන ලෙස ඉල්ලා සිටී.

කිසිම සහාබාවරයෙක් තම මෙලොව අවශ්‍යතාවය වෙනුවෙන් ප්‍රාර්ථනා කරන්නයැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් ඉල්ලා නොමැත. නමුත් මුස්ලිම්වරුන්ගේ පොදු යහපත වෙනුවෙන් ඉල්ලා ඇත. උදාහරණයක් වශයෙන් තබූක් සටනේදී සොල්දාදුවන් සංඛ්‍යාවෙන් අඩු වී ගිය අවස්ථාවෙහි ආහාර ලබා දෙන මෙන් ප්‍රාර්ථනා කරන ලෙස නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් උමර් (රළියල්ලාහු අන්හු) තුමා ඉල්ලා සිට ඇත. අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා තම මවට ඉස්ලාමය දෙසට මග පෙන්වන ලෙස නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් ඉල්ලා සිට ඇතග එමනිසා අනුමතිය නොමැති මාර්ගයෙන් වසීලා පතන්නේ නම් එය ෂිර්කයේ පැටලෙන්නේය. නැතහොත් බිද්අත් කළ වැරදිකරුවෙකුවන්නේය. කෙනෙක් අනෙකුත් මැවීම් මගින් හෝ අල්ලාහ් නොවන වෙනත් දෙවියන්ගෙන් හෝ වසීලා සොයා සිටින්නේනම් ඔහු මහා ෂිර්ක් කළ පුද්ගලයන්ගෙන් කෙනෙකි. තවද මිත්‍යා දෙවිවරුන් හා පිලිමයන්ගෙන් වසීලා සෙවීම, ජාහිලියියා කාලයේ කාෆිර්වරුන් කළ මහා වරද කල කෙනෙකු වන්නේයග මෙය මූලික කරගෙන බලන කල්හි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් වසීලා පැතීම කොටස් තුනක් වන්නේය.

1. කෙනෙක් තමා සිදු කළ හා සිදු කරන යහක්‍රියාවන් මගින් වසීලා පැතීම, මෙය අනුමැතිය ඇත්තකි.

2. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ජීවිත්ව සිටින විට එතුමාගේ ප්‍රාර්ථනා මගින් වසීලා පැතීම.
3. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මාර්ගයෙන් වසීලා පැතීම මෙම ක්‍රමය අල් කුර්ආනයේ හෝ හදීසයේ පෙන්වා නොදුන් ක්‍රමයක් නිසා මෙම ක්‍රමය අනුමැතිය නොලද්දකිග මෙලෙස කිරීම බිද්අත් වේ.

## 37) දුආ ප්‍රාර්ථනා කර අවසන් වීමෙන් පසුව දෑත මුහුණෙහි පිරිමැදීම.

කෙනෙක් ප්‍රාර්ථනා කර අවසන් කිරීමෙන් පසුව තම දෑතින් මුහුණ පිරිමැදීම සම්බන්ධයෙන් බොහෝ සාධක දැක ගත හැකිය. එම හදීසයන් සියල්ල කිසිම සැකයකින් තොරව බලහීන හදීසයන්ය. මේ සියල්ල හසන් යන තත්වයට ගෙන ආ හැකිද යන්න පිළිබදව බොහෝ මතයන් දැකිය හැකිය.

සමහර ඉමාම්වරු සලාතයේ කරන ප්‍රාර්ථනාවන් හැරෙන්නට අන් සියළු ප්‍රාර්ථනාවන්ගෙන් පසුව දෑත මුහුණෙහි පිරිමැදිය හැකි ලෙස පවසතිග නමුත් සලාතයේ කරනු ලබන ප්‍රාර්ථනාවන්හි (උදාහරණ වශයෙන් කුනුත් හි කරනු ලබන ප්‍රාර්ථනය) පිරිමැදීම නොකළ යුතුය. අෂ් - ෂෙයික් අබූ සෙයිද් නැමැත්තා "කෙනෙක් කැමතිනම් සලාතයේදී කරන ප්‍රාර්ථනාවන් වලින් අනතුරුව මුහුණ පිරිමැදිය හැකිය"යැයි පවසයිග නමුත් මෙම අදහසට කිසිදු සාධකයක් නොමැත.
ප්‍රාර්ථනාවකින් පසුව දෑතින් මුහුණ පිරිමැදීම " කළ හැකිය" යනුවෙනුත් "නොකළ යුතුය" යනුවෙනුත් විද්වතුන් හා පෙර ඉමාම්වරු මගින් වාර්තා කර ඇති බැවින් ගවේෂණය නොකර අත්හරීම නුසුදුසුය. කෙසේ හෝ වාර්තාවන් දෙස බලන කල මුහුණ පිරිමැදීම අනුමැතිය ලද්දක් නොවේ යන නිගමනයට එලඹිය හැකියග සියල්ල දන්නා අල්ලාහ් පමණි.

## 38) මියගිය තැනත්තා වෙනුවෙන් සාධාරණව ප්‍රාර්ථනා කිරීම.

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා (රලියල්ලාහු අන්හු) තුමා  මියගිය තැනත්තා වෙනුවෙන් ප්‍රාර්ථනා කරන විට සාධාරණව කටයුතු කරන්න යනුවෙන් ප්‍රකාශ කලේය (අබූ දාවුද්, ඉබ්නු මාජා). මෙම හදීසය මූලික කරගෙන ඉමාම් ෂව්කානී (රහිමහුල්ලාහ්) පහත ආකාරයට සඳහන් කරයි. "මෙහි

සාධාරණාව සිටිය යුතුය යන කාරණාව නිශ්චිත කාරණාවන් හි පමණක් ප්‍රාර්ථනා කළ යුතුය යන්න නොව උක්ත පුද්ගලයා කෙරෙහි සාධාරණාව සත්‍යවන්තව (ඔහු භක්තිකයෙකු වුවත් පාපියෙකු වුවත්) සැබවින්ම මරණයට පත් වූ පුද්ගලයා පාපියෙකු වුවද ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම සහෝදර මුස්ලිම්වරයෙකුට අවශ්‍යයග තවද ඔහු වෙනුවෙන් කතාකිරීමේ අවශ්‍යතාවයෙන් මුස්ලිම්වරයා සිටීග තවද මේ හේතුවෙන් ඔහු ඉදිරියට ගෙන එනු ලැබේ.

## 39) මහපට ඇඟිල්ල තම දෑස් මත පිරිමැදීම.

මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ නාමය ඇසූ විට තමත මහපට ඇඟිල්ලට පිඹ දෑස් පිරිමැදීමේ පුරුද්ද මුස්ලිම්වරුන් අතර දැකිය හැකි ක්‍රියාවකි. මෙය මිත්‍යා වාර්තාවන් පසුබිම් කරගෙන ඇති වූවකි.

අබුල් අබ්බාස් අහ්මද් බින් අබී බක්කර් අල් යමානී නැමැත්තා තම " මුජිබාතුර් රහ්මාන් ව අසාඉමුල් මඃරිෆා" යන ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් කර ඇත. යමෙකු අෂ්හදු අන්න මුහම්මදර් රසූලිල්ලාහ් යැයි මුඅද්දින් පවසන විට මර්හබන් හබීබී මුහම්මද් බින් අබ්දිල්ලාහ් යැයි පවසා තම ඇඟිලි මත සිඹ හෝ පිඹ මුහුණෙහි පිරිමදින්නේ ද, ඔහුට ඇස් සම්බන්ධ කිසිම රෝගයක් වැළඳ නොගනීයන වැරදි අදහස මූලික කරගෙන බිහි වූවකිග නමුත් මෙම ක්‍රමය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ මඟපෙන්වීම්වලට හාත්පසින්ම වෙනස් වන අතර බිද්අතයක් වේ.

## 40) කණ්ඩායමක් ලෙස සිට ප්‍රාර්ථනා කිරීම.

මෙයද බහුතර මුස්ලිම්වරු අතර සුන්නාවක් යැයි ප්‍රසිද්ධ කරුණකි. මෙය අල් කුර්ආනයේ හෝ සුන්නාවෙහි හෝ ඉතා බලහීන හදීසයක හෝ නොමැති කරුණකි. බොහෝ මස්ජිදයන් හි සෑම ෆර්ල් සලාතයකටම පසුව ඉමාම් ශබ්ද නගා ප්‍රාර්ථනා කරන අතර පසුපස ඇති අය ආමීන් පවසතිග මෙම ක්‍රියාව ආගමෙහි අළුතින් ඇතුළත් එකක් යන්නෙහි කිසිම සැකයක් නොමැත. මෙය නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හෝ එතුමාගේ සහාබාවරුන් හෝ ඔවුන්ට පසු පැමිණි යහගැත්තන් නොකළ ක්‍රියාවකි.

සැබවින්ම මෙයට පටහැනි සත්‍යයක් දැකිය හැකිය. එනම් උමර් (රළියල්ලාහු අන්හු) තුමාගේ අවධියෙහි ඉඩොරයක් ඇති වූ

අවස්ථාවෙහි උමර් (රළියල්ලාහු අන්හු) තුමාණෝ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළහග තවද අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමාගෙන්ද තනියම ප්‍රාර්ථනා කරන ලෙස ඉල්ලා සිටියේය. එතුමා අනෙකුත් අයව එකතු කරගෙන ප්‍රාර්ථනා කරන ලෙස හෝ අනෙකුත් අයට එතුමා සමඟ එක් වී ප්‍රාර්ථනා කරන ලෙස හෝ ඉල්ලා නොසිටියේය. මෙම සිදුවීම අනෙකුත් සහාභාවරු නොදැන සිටියහ.

## 41) සාමූහිකව ප්‍රාර්ථනා කිරීම බිද්අත් වන්නේයග

කලීෆා උමර් (රළියල්ලාහු අන්හු) තුමගේ අවධියෙහි ආණ්ඩුකාර වරයෙකු "එක් කණ්ඩායමක් එක්රැස් වී මුස්ලිම්වරුන් වෙනුවෙනුත්, කලීෆා උමර් (රළියල්ලාහු අන්හු) වෙනුවෙනුත් ප්‍රාර්ථනා කර යනුවෙන් සඳහන කොට ලිපියක් යැවූහ. එවිට උමර් (රළියල්ලාහු අන්හු) තුමා තම සේවකයින් කැටුව පොලු රැගෙන ගොස් ඔවුන්ට පහර දෙන ලෙස අණ කළ අතර ඔවුන්ට සහයද ලබා දුන්හ. ඔවුන් ප්‍රාර්ථනා කලේ උමර් (රළියල්ලාහු අන්හු) තුමාණෝ එවකට කලීෆා වශයෙන් කටයුතු කළ නිසා යග මෙම වාර්තාව සාමූහිකව ප්‍රාර්ථනා කිරීම ඉස්ලාමයෙහි අළුතින් බිහි වූ (බිද්ආ)වක් යන්නත් එම ක්‍රියාව සහාබාවරු අනුමත නොකළ බවත් පැහැදිලි කර සිටී.

සාමූහිකව ප්‍රාර්ථනා කිරීම සමහර අවස්ථාවන්හි අවසර ලත් එකක් වන අතර අනෙකුත් අවස්ථාවන්හි සාමූහිකව ප්‍රාර්ථනා කිරීමත් එය පුරුද්දක් කරගැනීමත් බිද්අත් වන්නේය.තවද මෙය ප්‍රාර්ථනාවට ඇති කොන්දේසි වලින්ද එකක් නොවේ.

(ඉබ්නු අබී ෂෙයිබා - 6242, අබූ සෙයිද්)

## 42) ප්‍රාර්ථනා කරන විට තම දෑත් පපුවෙහි ගසාගැනීම.

කෙනෙකු ප්‍රාර්ථනා කරන අවස්ථාවෙහි තම දෑත් පපුවෙහි ගසාගැනීම, ප්‍රාර්ථනා වෙනුවෙන් ඇති ආදාබ් වලට හා රීතීන් වලට පටහැනිය. මන්ද යත් ප්‍රාර්ථනා අවස්ථාවෙහි තම දෑත් විහිදුවා තිබිය යුතු ය යන්න සුන්නා ව අවධාරණය කරයි. මෙවැනි ක්‍රියා කලාපයන් කිතුනුවන්ගේ නැමදුම්වවල ප්‍රතිඵලයයි.

## 43) නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ මගපෙන්වීම අනුව විශේෂිත නොවූ කාල වේලාවන්හි ප්‍රාර්ථනා කිරීම.

එනම් ප්‍රාර්ථනා කබූල් වීම(පිළිගැනීම) ලෙස විශේෂිත නොකළ කාලයන්හි, ස්ථානයන්හි ප්‍රාර්ථනා කිරීම ප්‍රාර්ථනාවන් පිළිගැනෙන වේලාවන් ලෙස අනුමාන කර එම වේලාවන්හි ප්‍රාර්ථනා කිරීමට කටයුතු කිරීමත් (උදාහරණ වශයෙන් රබීඋල් අව්වල් මස 12 දින) යන මේවා ආගමෙහි අනුමත නොලත් බිද්අතයන්ය.

එවගේම අල් කුර්ආනය හා සුන්නාව පෙන්වා නුදුන් සමහර ක්‍රියාවන් කිරීමට පෙර හෝ කිරීමෙන් අනතුරුව නිශ්චිත ප්‍රාර්ථනාවක් සකසාගෙන අල්ලාහ් අධික කුසල් ලබා දෙනු ඇතයි විශ්වාස කිරීම බිද්අත් වේ.

උදාහරණ වශයෙන් කඃබාව තවාෆ් කරන අවස්ථාවෙහි එක් එක් තවාෆයන් හි සමහර ප්‍රාර්ථනාවන් සුන්නා ලෙස සිතා පාරායණය කර එතිග නමුත් අල් කුර්ආනයේ හෝ සුන්නාවෙහි එවැනි මග පෙන්වීමක් නොමැතග එමනිසා පුද්ගලයෙකු මෙය සුන්නාවකි, මෙය අමතර කුසල් ලබාදෙන්නකි යනුවෙන් සිතා අනුගමනය කරන්නේ නම් ඔහු බිද්අත් කරන්නේය.

එවගේම අළුත් අවුරුදු සුභපැතුම්, නියඟ කාල හා වැසි කාල පටන් ගැනීමට පෙර දුආ ප්‍රාර්ථන කිරීම නැතහොත් ෂරීආවෙහි අනුමැතිය නොලත් සිදුවීමකට පෙර හෝ පසු ප්‍රාර්ථනා කිරීම යන සියල්ල බිද්අත් වේ. එවගේම ෂරීආව මගින් හඳුන්වා දී සමහර ප්‍රාර්ථාවන් ඒවා ඒ ඒ ස්ථාන වල හා ඒ ඒ අවස්ථාවන්වල භාවිතා නොකර ඒවා මගින් වෙන අවස්ථාවන්වල ප්‍රාර්ථනා කිරීමද සුන්නාවට පටහැනි වේ.

උදාහරණයක් වශයෙන් මස්ජිදයට ඇතුළු වන විට නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් දුආවක් පෙන්වාදී ඇති අතර එය මස්ජිදයට ඇතුළුවන අවස්ථාවෙහි පමණක් කළ යුතුය. එම දුආව නිවසට ඇතුළු වන විට කරන්නේ නම් එය සුන්නාවට පටහැනි වේ.

## 44) දුආ ප්‍රාර්ථනාව මහා දුක්කරදරවලින් කෙසේ අරක්ෂාකරයි ද.

දුආ ප්‍රාර්ථනාව යනු ප්‍රතිකාර හා ඖෂද වලින් ඉතා උතුම් ඖෂදයකි. මහා දුක් කරදරවල සතුරා යග එමනිසා දුආව එම කරදරවලින් වලක්වන අතර ඒවාට ප්‍රතිකාර කර ආරක්ෂා කරයිග ඒවාට ගොදුරු වුවද එහි බලපෑම අඩු කරයිග නැතිනම් නැතිකරයිග තවද එය ආත්ම

විශ්වාසය ඇති කෙනාගේ අයුධය වන්නේය. එමනිසා ප්‍රාර්ථනාව පහත සඳහන් මාර්ග තුනෙන් ප්‍රතිකාර කරයි.

1.දුක් කරදරයට වඩා දුආාව බලවත් නම් එම කරදරය වලක්වාලයි
2.එම දුක් කරදරයට වඩා දුආාව බලහීන නම් දුආාව පරාජය කරගෙන පුද්ගලයෙකුට කරදරයක් උදා වුණි නම්, දුආාව බලහීනව පවතියි නම් එම කරදරය අඩු කරයි.
3ගඒවා එකක් ප්‍රතිවිරුද්ධ ව කටයුතු කර අනෙක වළක්වයි.

එමනිසා මිනිසාණනි,නියතවශයෙන්ම ඔබගේ ගමන දීර්ඝය. එහි අන්ත්‍රාවන් අධිකය. ඔබගේ ඉලක්කය ඉතා දුරය. රැවටීම් බහුලය. එමනිසා දුආාව භාවිතා කරන්න. ඔබගේ පාපයන් හා සතුරාගේ පාපයන් විනාශකර දමන්නට එය භාවිතා කරන්න. තවද ඔබගේ එක් එක් ඉලක්ක ළඟා කර ගැනීමට එය භාවිතා කරන්න. ඔබ ප්‍රියකරන ඉලක්කය ළඟා කර දීමට නියතවශයෙන්ම එය සටන්කරයි. දුආාව ඔබගේ තියුණු හා බලවත් ම ආයුධය.

සර්ව බලධාරී පරමාධිපතියාණනි මෙම පොතෙහි ඇති වැරදි හා අඩුපාඩු සමා කරනු මැනවි. අපගේ පරමාධිපතියාණනි යටහත්පහත් කළ මෙම කැපවීම පිළිගනු මැනවි.